සැ. යු.- (i) 2015.09.11 දින පළ වූ අංක 1,932 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,933 - 2015 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2015.09.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1266 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 සැප්තැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසර පත්‍ර ලැබීමට ගොවිජන පංතියට අයත් නොවන තැනැත්තන් තෝරාගැනීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරාගැනීමට පුත්තලම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2015 ඔක්තෝබර් 14 වැනි දින පෙ.ව. 10.00 ට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) *ඉඩමේ විස්තරය* :- 606 මනතිව්, 607 පාලවිය, 607ඒ - අට්ටවිල්ලුව, 607බී - මධ්‍යම, අට්ටවිල්ලුව, 607 සී - බෝධිරාජපුර, 607 ඩී පොත්තුවිල්ලුව, 615 - සෙල්ලකන්දල්, 615 ඒ - කල්අඩිය, 615බී - තම්මැන්නාගම, 615 සී - නෙළුම් වැව, 615 ඩී - සිරම්බියඩිය, 616- සෙනකුඩිරුප්පුව, 617 ඒ - මුල්ලිපුරම්, 617 බී - පුත්තලම නැගෙනහිර, 617 සී, මරික්කාර්වීදිය, 617 ඩී පරණ ජුම්මාපල්ලිය, 617 එෆ් පුදුකුඩිරුප්පුව, 618 - පුත්තලම දකුණ, 618 ඒ - තිල්අඩිය, 618බී - රත්මලයාය ග්‍රාම නිලධාරී වසම්වලට අයත් පදිංචිව සිටින, වගාකරන හා වාණිජ කටයුතු කරන රජයේ ඉඩම.

(ආ) *ඉඩම පිහිටි ගම* :- 606 මනතිව්, 607 පාලවිය, 607ඒ අට්ටවිල්ලුව, 607 බී -මධ්‍යම අට්ටවිල්ලුව, 607 සී - බෝධිරාජපුර, 607ඩී - පොත්තුවිල්ලුව, 615 සෙල්ලකන්දල්, 615 ඒ- කල්අඩිය, 615 බී- තම්මැන්නාගම, 615 සී -නෙළුම්වැව, 615 ඩී- සිරම්බියඩිය, 616 - සෙනකුඩිරුප්පුව, 617 ඒ- මුල්ලිපුරම්, 617 බී- පුත්තලම නැගෙනහිර, 617 සී 0 මරික්කාර්වීදය, 617 ඩී -පරණ ජුම්මාපල්ලිය, 617 එෆ් -පුදුකුඩිරුප්පුව, 618 - පුත්තලම දකුණ 618 ඒ- තිල්අඩිය, 618 බී - රත්මලයාය ග්‍රාම නිලධාරී වසම්වලට අයත් බිම් කොටස්.

(ඇ) *ග්‍රාම නිලධාරී වසම* :- 606 - මනතිව්, 607 පාලවිය, 607 ඒ - අට්ටවිල්ලුව, 607 බී - මධ්‍යම අට්ටවිල්ලුව, 607 සී - බෝධිරාජපුර, 607 ඩී පොත්තුවිල්ලුව, 615 - සෙල්ලකන්දල්, 615 ඒ - කල්අඩිය, 615 බී තම්මැන්නාගම, 615 සී - නෙළුම්වැව, 615 ඩී - සිරම්බියඩිය, 616 - සෙනකුඩිරුප්පුව, 617 ඒ - මුල්ලිපුරම්, 617 බී - පුත්තලම නැගෙනහිර, 617 සී -මරික්කාර්වීදිය, 617 ඩී පරණ ජුම්මාපල්ලිය, 617 එෆ්- පුදුකුඩිරුප්පුව, 618 - පුත්තලම දකුණ, 618 ඒ - තිල් අඩිය, 618 බී - රත්මලයාය.

(ඈ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාසය - පුත්තලම.

(ඉ) දිස්ත්‍රික්කය - පුත්තම.

(ඊ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය - (වාරිමාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති).

(i) වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩ ඉඩම්.
(ii) වාරිමාර්ග පහසුකම් සලසා ඇති කුඹුරු ඉඩම් (ප්‍රාදේශීය සභා සීමාව තුළ).

(උ) අන්සතු කරනු ලබන ඒකකය.-

1. නේවාසික කටයුතු සඳහා (නගර සභා සීමාව තුළ) පර්. 6 සිට පර් 10 ට දක්වා
2. ව්‍යාපාරික කටයුතු සඳහා (නගර සභා සීමාව තුළ) පර්. 2.5 සිට පර්. 10 දක්වා
3. නේවාසික කටයුතු සඳහා (ප්‍රාදේශීය සභා සීමාව තුළ) පර්. 15 සිට රූඩ් 02 දක්වා
4. කෘෂිකාර්මික කටයුතු සඳහා (ප්‍රාදේශීය සභා සීමාව) පර් 15 සිට අක්. 50 දක්වා
5. ව්‍යාපාරික කටයුතු සඳහා (ප්‍රාදේශීය සභා සීමාව තුළ) පර්. 15 සිට අක්. 02 දක්වා

2. පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පහත සඳහන් පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.

ඉල්ලුම්කරුවන් ඉඩම් නොමැති පුද්ගලයින් ලෙස ලියාපදිංචි වූ අය විය යුතු ය.

(i) නගර සභා සීමාව තුළ ස්ථිර වශයෙන් පදිංචි සිට නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන අය.
(ii) නගර සීමාව තුළ ව්‍යාපාරික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන අය.
(iii) ප්‍රාදේශීය සභා සීමාතුළ කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන අය.
(iv) ප්‍රාදේශීය සභා සීමා තුළ වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන අය.
(v) ප්‍රාදේශීය සභා සීමාව තුළ නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන අය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2015 ඔක්තෝබර් මස 12 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම් පුත්තලම වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය. (ඉල්ලුම්පත්‍රයේ පිටපතක් මීට අමුණා ඇත.)

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2015 ඔක්තෝබර් 14 වැනි දින පෙ.ව. 10.00 ට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරනු තැනැත්තා විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසරපත්‍රයක් ලැබෙන අතර, එය එහි සඳහන් කොන්දේසිවලට යටත්වනු ඇත.

7. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබී ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම වෙනුවෙන් පර්චස් එකකට රුපියල් 150 ක් බැගින් ගණන් බලනු මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මිලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල ද ලබාගත හැක.

* ඉඩම් අංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුත්තලම
* ජනපද නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුත්තලම.

* ග්‍රාමනිලධාරී

| | |
|---|---|
| * 606 - මනතිව් | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 607 - පාලවිය | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 607ඒ - අට්ටවිල්ලුව | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 607 බී - මධ්‍යම අට්ටවිල්ලුව | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 607 සී - බෝධිරාජපුර | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 607 ඩී - පොත්තුවිල්ලුව | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 615 - සෙල්ලකන්දල් | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 615 ඒ - කල්අඩිය | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 615 බී - තම්මැන්නාගම | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 615 සී - නෙළුම් වැව | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 615 ඩී - සිරම්බියඩිය | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 616 - සෙනකුඩිරුප්පුව | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 617 ඒ - මුල්ලිපුරම් | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 617 බී - පුත්තලම නැගෙනහිර | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 617 සී - මරික්කාර්වීදිය | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 617 ඩී - පරණ ජුම්මාපල්ලිය | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 617 එෆ් - පුදුකුඩිරුප්පුව | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 618 - පුත්තලම දකුණ | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 618 ඒ - තිල්අඩිය | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |
| * 618 බී - රත්මලයාය | ග්‍රාම නිලධාරී කාර්යාලය, පුත්තලම |

ජේ. එම්. ආර්. පී. ජයසිංහ,
පළාත් ඉඩම් කොමසාරිස්,
වයඹ පළාත.

2015 අගෝස්තු මස 31 වැනි දින දී ය.

රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා.................කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක............................ යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම :—————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
3. (i) ලිපිනය :—————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :—————.
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :—————.
4. ගෘහ මූලික අංකය :—————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :—————.
7. උපන් දිනය :—————.
8. විවාහක/අවිවාහක බව :—————.
9. රැකියාව :—————.
10. රැකියාව කරන ස්ථානය :—————.
11. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | පවුලේ පළවෙනි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :—————.
14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :—————.
    (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග)
15. නිවස පිහිටි ස්ථානය :—————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :—————.

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/විද්‍යාලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :—————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :—————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :—————.

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| | | |
| | | |

20. ඉඩම් ලාභියකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍යයක් බව හෙලි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

—————,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :—————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

අනු අත්සන් කරමි.

—————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :—————.
ලිපිනය :—————.

## දිවුරුම් ප්‍රකාශය

.................................. දිස්ත්‍රික්කයේ............................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .......................... ග්‍රාම නිලධාරි වසමේ පදිංචි.................................... වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද, සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1793 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේ ම ඉහත කී අක්කර ................... රූඩ්....................... පර්. .................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් සහතික කරමි.

..............................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

—————,
සාමදාන විනිශ්චයකාර තැන.

09-414

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.